# ශ්‍රී ලංකාවේ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා

සී.ඩී.ඩබ්.ඒ.සී.එම්.දසනායක[1]

**සංක්ෂේපය**

ලෝකයේ විවිධ රටවල ආර්ථික තත්ත්වයන්හි කැපීපෙනෙන වෙනස්කම් දක්නට ලැබෙන අතර සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකයේ දක්නට ලැබෙන උපනති, සංවර්ධිත රටවල ආර්ථිකයේ දක්නට ලැබෙන උපනති හා එකිනෙක වෙනස් වේ. සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ ලංකා ආර්ථිකයේ දක්නට ලැබෙන උපනතීන් පිළිබඳ අවධානය යොමු කිරිමේදි දක්නට ලැබෙන්නේ ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ජපානය ආදි සංවර්ධිත රටවලට සාපේක්ෂව වෙනස් ආකාරයකි.මානව ප්‍රාග්ධනය නිසි ලෙස උපයෝජනය නොකිරීම, ආයෝජන හිගකම, ස්වභාවික සම්පත් නිසි ලෙස යොදා නොගැනිම, තාක්ෂණික දැනුමේ හිගකම, ව්‍යවසායකත්ව නොගැලපිම් වැනි හේතු සාධකයන්ගේ දූර්වලතාවන් මෙයට හේතු වේ.2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී මූර්ත දේශීය නිෂ්පාදිතයේ, ජාතික ඉතුරුම්, සේවා වියුක්තිය,විදේශීය අංශය, මුදල් අංශය යනාදී අංශයන්හි වර්ධනයන් පිළිබඳව මෙම ලිපියෙහි අන්තර්ගත වේ.

මුඛ්‍ය පදඃ ආර්ථික තත්ත්වය, උපනති

## මූර්ත අංශයේ වර්ධනය

ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශිය නිෂ්පාදිතය 2015 වසරේදී සියයට 4.8 කින් වර්ධනය විය. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වන සාම්ප්‍රදායික වෙතින් ඇති ඉල්ලුමෙහි වර්ධනය මන්දගාමීවීම, අපනයන අංශය මත බලපෑම් ඇතිකරන ලද අතර එක්සත් ජනපදයෙහි ආර්ථිකය ශක්තිමත් වීම හේතුවෙන් කෙටිකාලීන ප්‍රාග්ධන ප්‍රවාහ පිටතට ගලා යාම කඩිනම් විය. ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩ මිල ගණන් අඩුවීම හේතුවෙන් මෙම ප්‍රවණතාවන්ගේ බලපෑම තව දුරටත් සමනය විය. එසේ වුව ද විශේෂයෙන් රජ්‍ය අංශයේ සේවකයන්ගේ ආදායම් ඉහළ යාම හේතුවෙන් දේශීය පරිභෝජනය යතා තත්වයට පත්විය. 2015 වසර තුළදී කෘෂිකාර්මික අංශය ආශ්‍රිත ක්‍රියාකාරකම් සියයට 5.5 කින් ද , සේවා අංශය ආශ්‍රිත ක්‍රියාකාරකම් සියයට 5.3 වර්ධනය වූ අතර කර්මාන්ත ආශ්‍රීත ක්‍රියාකාරකම් සියයට 3.0 කින් වර්ධනය විය.

මූල්‍ය සේවාවන් ,නිශ්චල දේපළ ,ප්‍රවාහන කටයුතු හා තොග හා සිල්ලර වෙළඳාම යනාදී අංශයන්ගේ වර්ධනයත් සමඟ සේවා අංශය සියයට 5.3 කින් වර්ධනය විය. ඉදිකිරීම් කටයුතු හා පතල් සහ කැණීම් කටයුතුවල සුළු පසුබෑම මධ්‍යයේ ප්‍රධාන වශයෙන් ම නිෂ්පාදන කටයුතුවල වර්ධනය හේතුවෙන් කාර්මික කටයුතු සියයට 3.0 කින් වර්ධනය විය. ධීවර කර්මාන්තය ,රබර්වගාව සහ තේ වගාව යන අංශයන්හි පහළයාම මධ්‍යයේ වුවද වී හා එළවළු වගාවන්හි සැලකිය යුතු වර්ධනය හේතුවෙන් කෘෂිකාර්මික කටයුතු සියයට 5.5 කින් ප්‍රසාරණය විය.

වියදම් ප්‍රවේශය යටතේ ,2015 වර්ෂයේදී මූර්ත දළ දේශිය නිෂ්පාදනයෙහි වර්ධනය වැඩි වශයෙන් ම පරිභෝජන යාම හේතුවෙන් සිදුවූ අතර ආයෝජන කටයුතු ද දළ


[1] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා තෙවන වසර, cmaduwanthi28@gmail.com

දේශිය නිෂ්පාදනයට සුළු දායකත්වයක් දැක්වී ය. රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම් ඉහළ වේගයකින් වර්ධනය වීම සඳහා 2015 වර්ෂයේදී රාජය අංශයේ සේවකයන්ගේ වැටුප් හා වේතනවල ඉහළයාම හේතුවිය. පොළී අනුපාතික අඩු මට්ටමක පැවතීම හා මූර්ත වැටුප් ඉහළ යාම හේතුවෙන් පෞද්ගලික පරිභෝජන වියදම වසර තුළදී වර්ධනය විය.

පෞද්ගලික ඉතුරුම් බොහෝ සෙයින් නොවෙනස්ව පැවති බැවින් අපේක්ෂිත ප්‍රමාණයට වඩා රාජ්‍ය ආදායම් අඩුවීමත් සමග ම පුනරාවර්තන වියදම අපේක්ෂිත මට්ටමට වඩා රජයේ ආදායම අඩුවීමත් සමග පුනරාවර්තන වියදම අපේක්ෂිත මට්ටමට වැඩිවීම හේතුවෙන් නිර්--.ඉතුරුම් ඉහළ යාම වසර තුළ දේශීය ඉතුරුම් පිරිහීමට හේතු වී ඇත. තව ද සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල රුපියල් වල වටිනාකම සුළු වශයෙන් ඉහළ ගිය ද විදේශිය ශුද්ධ සාධක ආදායම පිරිහීමත් සමග ආයෝජන ඉපැයිම පහළ යාම හා විදේශ විනිමය ගලා යාම ඉහළ යාම 2015 වසර තුළදී ජාතික ඉතුරුම් දළ දේශිය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස පසුගිය වසරෙහි වූ සියයට 29.5 සිට 2015 වසරේදී සියයට 27.8 දක්වා පහළ ගියේ ය.

**ඉතිරිකිරීම් හා ආයෝජන**

ප්‍රස්තාර අංක 01 : ශ්‍රී ලංකාවේ මෑත කාලීන ඉතිරිකිරීම් හා ආයෝජන




මුලය ; මහ බැංකු වාර්ෂික වාර්තාව,2015


**සේවා වියුක්තිය**

කාන්තාවන්ගේ ශ්‍රම බලකා සහභාගීත්වයේ සුළු වර්ධනය හේතුවෙන් සේවා වියුක්ති අනුපාතය 2014 වර්ෂයේ වාර්තා කළ සියයට 4.3 ක් වූ අතර 2015 වසරේදී සියයට 4.6 දක්වා ඉහළ ගියේ ය. 2014 වර්ෂය හා සැසඳීමේදී ,2015 වසරේදී පුරුෂ සේවා නියුක්ති අනුපාතය සියයට 3.1 සිට සියයට 3.0 දක්වා අඩු වූ අතර කාන්තා සේවා වියුක්ති අනුපාතය සියයට 6.5 සිට සියයට 7.6 දක්වා ඉහළ ගියේ ය.ශ්‍රම බලකාය

තුළ ග්‍රාමීය අංශයේ කාන්තා සහභාගීත්වය ඉහළ යාමත් සමඟ 2015 වසරේ දී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2014 වසර තුළදී වූ සියයට 53.3 සිට සියයට 53.8 දක්වා ඉහළ ගොස් ඇත. මැද පෙරදිග හු දේශපාලන අවිනිශ්චිතතාව ඉහළ යාම හා ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි පසුබෑම හේතුවෙන් විදේශ රැකියා සඳහා යොමුවන සංඛ්‍යාව සියයට 12.4 කින් පසුබෑම හේතුවෙන් සේවා වියුක්ති අනුපාතයට හා ශ්‍රම බලකා සහභාගී අනුපාතයට දැඩි ලෙස බලපාන ලදී.

### සේවා වියුක්ති අනුපාතයන්

ප්‍රස්තාර අංක 02 : ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතයන්




මූලය ; මහ බැංකු වාර්ෂික වාර්තාව,2015

### විදේශීය අංශයේ වර්ධනය

ඛනිජ තෙල් ආනයන වියදම අඩු වීමේ ප්‍රතිලාභය තිබියදීත් ඉන්ධන නොවන ආනයන වර්ධනය වීම හා අපනයන ආදායම් අඩුවීම පෙන්නුම් කරමින් වෙළෙඳ හිඟය 2014 වසරට සාපේක්ෂව සියයට 1.7කින් සුළු වශයෙන් පුළුල් විය. මේ වසර තුළදී සේවා ගිණුමෙහි ක්‍රියාකාරීත්වය වර්ධනය වීමට සංචාරක පැමිණීම් අඛණ්ඩව වර්ධනය වීම හා සංචාරකයන්ගේ වියදම් වර්ධනය වීම හේතු වී ඇත.2015 වසරේදී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය තව දුරටත් පුළුල් විය. ද්විතියික ආදායම් හා සේවා ගිණුම්වල අතිරික්තයන් විදේශීය ජංගම ගිණුමේ ඉහළ අගය අවම කිරීමට උපකාරී විය. දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස ජංගම ගිණුමේ හිඟය 2014 වර්ෂයේ පැවති සියයට 2.5 හි සිට 2015 වර්ෂයේදී සියයට 2.4 දක්වා සුළු වශයෙන් අඩු වුව ද නිරපේක්ෂ වශයෙන් එය සුළු වශයෙන් වර්ධනය විය. ජංගම ගිණුමෙහි පැවති මධ්‍යස්ථ ක්‍රියකාරීත්වය සමඟ රජය ,බැංකු හා පෞද්ගලික අංශ වෙත ලැබුණු ණය හා සෘජු ආයෝජන අඩු වීම සහ රජය සුරකුම්පත් වෙළෙඳපොලෙන් විදේශීය ආයෝජන ඉවත් කර ගැනීමේ ආකාරයට මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඩු වීම හේතුවෙන් ගෙවුම් තුලනයෙහි එ.ජ. ඩොලර් මිලියන 1489 ක හිඟයක් වාර්තා විය.

ගෙවුම් තුලනයේ පිරිහීමත් සමඟ රටෙහි දළ නිළ සංචිත ප්‍රමාණය 2014 වර්ෂයේ අවසානයේ පැවති එ.ජ. ඩොලර් බිලියන 8.2ක සිට 2015 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 7.3 ක් දක්වා අඩු විය. කෙසේ වෙතත් 2015 වසර අවසාන වන විට එ.ජ. ඩොලරයට සාපෙක්ෂව රුපියල සියයට 9.03ක අවප්‍රමාණයක් වාර්තා කළේ ය.

2015 වසරේ දී වෙළෙඳ ගිවිසුමේ හිඟය නාමික වශයෙන් සියයට 1.7 කින් පුළුල් වුව ද ද.දේ.නි. යේ ප්‍රතශතයක් ලෙස එය සුළු වශයෙන් අඩු විය. ආනයන වියදම මන්දගාමී වුව ද අපනයන ආදායම විශාල ලෙස අඩු වීම 2015 වසර්දී වෙළෙඳ හිඟය පුළුල් වීමට හෙතු විය. මේ අනුව වෙළෙඳ හිඟය 2014 වසරේ එ.ජ. ඩොලර් මිලියන 8.287 හි සට 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 8430 දක්වා වර්ධනය විය. එසේ වුව ද ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස වෙළෙඳ හිඟය 2014 වසරේ පැවති 10.4 සිට 2015 වසරේ දී සියයට 10.2 දක්වා සුළු වශයෙන් අඩු විය.


ජාත්‍යයන්තර වෙළෙඳපොලෙහි භාණ්ඩ මිල ගණන් අඩුවීම, දියුණු ආර්ථිකයන්ගේ ආර්ථික වර්ධන වේගයන් අඩුවීම, ශ්‍රී ලංකාවේ අපනයන කර්මාන්ත බොහෝමයක හූ දේශපාලනික අස්ථාවරතාවය හා යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවෙන් මත්ස්‍ය ආනයනය සීමා කිරීම අපනයන ආදායම් සැලකිය යුතු අඩුවීම සඳහා හේතු විය. කුළුබඩු හා ප්‍රවාහන උපකරණ අපනයන ආදායම් සැලකිය යුතු වර්ධනයක් වාර්තා කල ද තේ රබර් නිෂ්පාදිත, රෙදිපිළි හා ඇගලුම් සහ මුහුදු ආහාර අපනයන ආදායම අඩුවීම අපනයන ආදායමේ සමස්ත අඩුවීමට හේතු විය.

2015 වසරේදී ඉන්ධන නොවන ආනයන වියදම සියයට 9.6කින් සැලකිය යුතු ලෙස වර්ධනය වුව ද සමස්ත ආනයන වියදම සියයට 2.5කින් අඩුවිය. කෙසේ වුව ද පෞද්ගලික රථවාහන සහ ආහාරමය නොවන අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා වූ වියදම ඉහළ අගයක් ගැනීම ඉන්ධන නොවන අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා වූ වියදම ඉහළ අගයක් ගැනීම ඉන්ධන නොවන ආනයන වියදම වර්ධනය වීම සඳහා විශාල දායකත්වයක් දැක්වී ය.

2වෙළෙඳ හා ප්‍රාථමික ආදායම් ගිණුම්වල හිඟය පුළුල් වීම හමුවේ වුව ද සේවා හා ද්විතික ආදායම් ගිණුම්හි අතිරික්ත හේතුවෙන් 2015 වසරේ දී විදේශ ජංගම ගිණුමේ ශේෂය 2014 වසරේ වාර්තා වූ අගය ම බොහෝ දුරට සමාන විය. සංචාරක සේවා උප අංශයෙහි ඉහළ ක්‍රියාකාරිත්වය සහ ප්‍රවාහන, සන්නිවේදන, පරිගණක හා තොරතුරු සේවා උප අංශයෙහි ක්‍රියාකාරිත්වය වසර තුළදී විදේශ සේවා ගිණුමෙහි වර්ධනය කෙරෙහි දායක විය. වෙළෙඳ, සේවා, ප්‍රාථමික හා ද්විතීක ආදායම් ගිණුම්හි ප්‍රවනතාවයක් සමඟ පෙර වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1988 ක හිඟයට සාපේක්ෂව 2015 වසරේ දී ජංගම ගිණුම එ.ජ. ඩොලර් මිලියන 2009 ක හිඟයක් වාර්තා කළේ ය. කෙසේ වෙතත් දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස ජංගම ගිණුමෙ හිඟය පසුගිය වසරේ දී සියයට 2.4 දක්වා සුළු වශයෙන් අඩු විය.

**ගෙවුම් තුලනය**

ප්‍රස්තාර අංක 03 : ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනය




මූලය ; මහ බැංකු වාර්ෂික වාර්තාව,2015

ගෙවුම් තුලනය 2014 වසරේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 1369 ක අතිරික්තයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1489 ක හිඟයක් වාර්තා කළේ ය. නියමිත විදේශ ණය සේවාකරණ ගෙවීම් කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය පියවීම සමස්ත ණය පහසුකම් යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත සිදු කළ ගෙවීම් සහ දේශීය විදේශීය විනිමය වෙළෙඳපොල වෙත ද්‍රවශීලතාව සැපයීම, දළ නිල සංචිත 2014 වසර අවසානයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් බිලියන 8.2 සිට 2015 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 7.3 දක්වා පහත වැටීමට හේතු විය.

මුළු විදේශ විනිමය වත්කම් 2014 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 9.9 සිට 2015 වසර අවසානයේ එ.ජ. ඩොලර් බිලියන 9.3 කට අඩු වූ අතර මුළු විදේශ වත්කම් ප්‍රමාණය භාණ්ඩ ආනයනික මාස 5.9 කට සහ භාණ්ඩ හා සේවා ආනයනික මාස 4.9 කට සමාන විය. 2015 වසර අවසානය වනවිට දළ නිල සංචිත වත්කම් තත්ත්වය රටෙහි කෙටිකාලීන ණය හා වගකීම් වලින් සියයට 60 ක් ආවරණය කළේ ය.

2015 වසරේ දී රජය සහ පෞද්ගලික අංශවල විදේශීය ණයවලින් යුතු රටෙහි මුළු විදේශීය ණය ප්‍රමාණය ඉහළ ගියේ ය. විදේශීය ණය වශයෙන් ලැබුණු ලැබීම් මන්දගාමී වීමෙහි සහ ණය සේවාකරණ යටතේ සැලකිය යුතු ගෙවීම් ප්‍රමාණයක් වාර්තා වීමේ ප්‍රතිඵලයක් ලෙස රටෙහි මුළු විදේශ ණය ප්‍රමාණයෙහි නාමික අගය ඉහළ ගියේ ය. රටෙහි මුලු විදේශ ණය ප්‍රමාණය 2014 වසරේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 42.9 ට සාපේක්ෂව 2015 වසර අවසානය වනවිට එ.ජ. ඩොලර් බිලියන 44.8 ක් විය.

2015 වසරේ සැප්තැම්බර් මස ආරම්භයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විනිමය අනුපාතිකය වඩා නම්‍යශීලිව තීරණය වීමට ඉඩ හැරීමට තීරණය කළේ ය. ජංගම හා මූල්‍ය ගිණුම් වෙත වූ අපේක්ෂිත මට්ටමට වඩා අඩු විදේශ විනිමය ලැබීම්, ආනයන හා ණය සේවාකරණ ගෙවීම් සඳහා විදේශ විනිමය යෙදවීම් සහ රජයේ ණය සුරැකුම්පත් වෙළෙඳපොළින් ලද විදේශිය ආයෝජන ඉවත් කර ගැනීම, දේශීය විදේශි විනිමය වෙළෙඳපොළ මත සැලකිය යුතු මට්ටමක පීඩනයක් ඇති කළේ ය. මේ තත්ත්වය යටතේ විනිමය අනුපාතිකයෙහි අධික විචලනයන් අවම කිරීම සඳහා වසරේ පලමු මාස අට තුලදී ශ්‍රී ලංකා මහ බැංකුව දේශිය විදේශිය විනිමය වෙළෙඳපොල වෙත ශුද්ධ පදනම යටතේ එ.ජ. ඩොලර් බිලියන 1.9 ක් සැපයී ය. විනිමය අනුපාාතිකය තීරණය කිරීමේ දී අනුගමනය කළ නම්‍යශීලි ප්‍රතිපත්තිය නිසා 2015 වසර සැප්තැම්බර් මස 03වන දින දක්වා කාලයේදී ශ්‍රී ලංකා රුපියල සුළු වශයෙන් සියයට 2.57 කින් අවප්‍රමාණය විය. සමස්ත ලෙස රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 9.03 කින් අවප්‍රමාණය විය.


**රාජ්‍ය මූල්‍ය අංශයේ වර්ධනය**

රාජ්‍ය මූල්‍ය කළමණාකරණයට අභියෝගාත්මකව සිදු වු වර්ධනයක් ගණනාවක් නිසා 2015 වසර සඳහා වන අතුරු අයවැය මඟින් වසර තුළදී අයවැය හිඟයෙහි අපේක්ෂා කළ අඩුවීම ලඟා කර බැලීමට බාධාවන් ඇති විය. 2015 වසර සඳහා අතුරු අයවැයෙහි සඳහන් අයවැය ඉලක්කයන් සැලකිය යුතු ලෙස වෙනස් වෙමින් 2015 වසරේ රාජ්‍ය මූල්‍ය අංශයෙහි කාර්යසාධනය පිරිහිමට ලක්විය. රජයේ ආදායම අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු විම විශේෂයෙන් ම වැටුප් හා වේතන සඳහා වූ ඉහළ පුනරාවර්තන වියදම්, සුභසාධන වියදම් හා පොලි ගෙවීම් ඇස්තමේන්තුගත අගයට වඩා ඉහළ යාම යනාදිය සමස්ත අයවැය හිඟය මත දැඩි බලපෑමක් ඇති කළේ ය. ඒ අනුව ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය 2014 වසරේ පැවති සියයට 5.7 සිට 2015 වසරේ දී සියයට 7.4 දක්වා ඉහළ ගියේ ය. වසර තුල දී ලද විදේශිය මූල්‍යනය සාපේක්ෂව අඩුවීමත් සමඟ අයවැය හිඟය මූල්‍යනය කිරීම ප්‍රධාන වශයෙන් ම දේශීය මූලාශ්‍ර වලින් සිදුවිය. ඒ අතරින් බැංකු නොවන අංශය විශේෂ වේ. මුළු ශුද්ධ දේශීය මූල්‍යනයෙන් සියයට 508 ක් එනම් රුපියල් බිලියන 300.9 ක් බැංකු නොවන අංශයෙන් රජය ලබාගත් ණය ද 2014 වසරේ පැවති රුපියල් බිලියන 126.9 සිට වසර තුළ දී රුපියල් බිලියන 291.8 දක්වා ඉහළ ගිය අතර එය ද 2015 වසර සඳහා වන අයවැයෙහි සඳහන් වාර්ෂික වාර්තා ඇස්තමේන්තුව රුපියල් බිලියන 70.0 ට වඩා සැළකිය යුතු ලෙස ඉහළ අගයකි.

සංකීර්ණ බදු ක්‍රමය, සාපේක්ෂව බදු ආදායම් පදනම්, දුර්වල බදු අනුකූලතාව මෙන්ම බදු පරිපාලනය දියුණු කිරීමේ අවශ්‍යතාව යනාදිය ආදායම් රුස් කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. රජයේ අයවැයකරණය තුළ ආදායම් ගිණුමෙහි හිඟය සැළකිය යුත ලෙස ඉහළ යාම මඟින් පිළිබිඹු කරනුයේ රජයේ නඩත්තු වියදම් පියවීමට පවා රටේ ආදායම ප්‍රමාණවත් නොවන බවයි.

**රාජ්‍ය ආදායම, වියදම සහ සමස්ත අයවැය හිඟය**

ප්‍රස්තාර අංක 04 : ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම, වියදම සහ සමස්ත අයවැය හිඟය




මූලය ; මහ බැංකු වාර්ෂික වාර්තාව,2015

**මුදල් අංශයේ වර්ධනය**

අඛණ්ඩව පැවති අඩු උද්ධමනකාරී පරිසරයක් තුළ මහ බැංකුව විසින් වසර පුරා මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල්ව පවත්වා ගනු ලැබූ අතර ඉහළ ණය හා මුදල් ප්‍රසාරණය හේතුවෙන් උද්ධමනය මත ඇතිවිය හැකි අධික ඉල්ලුම් පීඩන මැඩපැවැත්වීමේ අරමුණින් 2015 අග භාගයේ දී සිට මුදල් ප්‍රතිපත්තිය ක්‍රමයෙන් දැඩි කිරීම ආරම්භ කරන ලදී. 2014 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වූ විවට වෙළෙඳපොල කටයුතු යටතේ නිත්‍ය තැන්පතු පහසුකම් සඳහා ප්‍රවේශ වීමේදී පනවනු ලැබූ සීමාවන් 2015 මාර්තු මාසයේ දී මහ බැංකුව විසින් ඉවත් කරනු ලැබූ නිසා කෙටිකාලීන පොලී අනුපාතිකවල ඇතිවිය හැකි උච්චාවචන මැඩපැවැත්විම සඳහා මහ බැංකුව අප්‍රේල් මාසයේ දී සිය ප්‍රධාන පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින් සියයට 6.0 ට සහ සියයට 7.50 දක්වා පදනම් අංක 50 කින් අඩු කරන ලදී.

2015 වසරේ දී අවසානයේ සිට මහ බැංකුව ක්‍රමයෙන් සිය මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමට කටයුතු කළේ ය. ඒ අනුව එතෙක් ක්‍රියාත්මක වූ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි අවසානය සනිටුහන් කරමින් 2016 ජනවාරි මස 16 වැනි දින ආරම්භ වන සංචිත කාලපරිච්ඡේදයේ සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍ර ලාභි වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු වගකීම් සඳහා වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 7.50 දක්වා ප්‍රතිශතාංක 1.50 කින් ඉහළ නංවන ලදී. එසේම ආර්ථිකයේ ඇතැම් තෝරාගත් අංශ වෙත අධික ලෙස ණය සැපයීම පාලනය කිරීම සඳහා 2015 අවසාන කාර්තුව තුළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග දෙකක් හඳුන්වා දෙන ලදී.

මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය මුදල් ඉලක්කකරණය හා නම්‍යශීලි උද්ධමනකරණය යන ද්විත්වයෙහිම ලක්ෂණ සහිත වැඩි දියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුව යටතේ ආර්ථිකයේ වර්ධනයට උපකාරී වෙමින් මැදිකාලීනව උද්ධමනය මැදි තනි අගයක ස්ථායිව පවත්වා ගැනීමට මහ බැංකුව උත්සහ කරයි. මීට අදාළ ප්‍රතිපත්ති මෙහෙයුම් ක්‍රියාවලිය සැලකූ විට මුදල් ප්‍රතිපත්තියෙහි මෙහෙයුම් ඉලක්කය වන කෙටිකාලීන පොලී අනුපාතික විශේෂයෙන්ම බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අපේක්ෂිත දිශාවට හැසිරවීම සඳහා මහ බැංකුව සිය ප්‍රතිපත්ති උපකරණ භාවිත කරයි.

රජය සහ පෞද්ගලික අංශයට ලබාදුන් ණය හේතුවෙන් පුළුල් මුදල් සැපයුමේ වර්ධනය 2015 වසර තුළ ඉහළ ගියේ ය. වාර්ෂික ලක්ෂමය පදනම මත පුළුල් මුදල් සැපයුමේ වර්ධනය 2014 වසරේ අවසානයේ පැවති සියයට 13.4 ක හා සැපයීමේ දී 2015 වසර අවසානය වන විට සියයට 17.8 දක්වා ඉහළ ගිය අතර වසර තුළදී පුළුල් මුදල් සැපයුමේ සාමාන්‍ය වර්ධනය සියයට 15.2 ක් විය. වසර තුළදී බැංකු පද්ධතිය තුළ ශුද්ධ විදේශ වත්කම් අඩු වූ අතර දේශීය ණය ප්‍රසාරණය හේතුවෙන් ශුද්ධ දේශීය වත්කම් ඉහළ යාම පුළුල් මුදල් ප්‍රසාරණය සඳහා මුළුමනින්ම හේතු විය. මෙම වසරේ පළමු මාස දහය තුළ දී බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශ වත්කම් රුපියල් බිලියන 413.6 කින් සැලකිය යුතු ලෙස අඩු වුවද එය මහ බැංකුව විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැදුම්කර නිකුතුවෙන් ලද විදේශ විනිමයෙන් කොටසක් මිලදී ගැනීමත් සමඟ වසරේ අවසාන මාස දෙක තුළ ශුද්ධ විදේශීය වත්කම්වල ඉහළ යාමක් පෙන්නුම් කළේය.ඒ අනුව 2015 වසර අවසානයේදී ශුද්ධ විදේශීය වත්කම්වල පහළ යාම රුපියල් බිලියන 313.3 ක් විය.

වෙළඳපොළ පොළී අනුපාතික වසරේ අවසාන කාලය තුළදී යම් ඉහළ යාමක් දක්නට ලැබුන ද 2015 වසර තුල සාපේක්ෂ අඩු මට්ටමක පවතින 2013 අප්‍රේල් මස පොළී අනුපාතික පහළ දැමීමත් සමඟ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ මෙම වෙනස්වීම තුළින් දේශීය මුදල් වෙළඳපොළ තුළ අතිරික්ත ද්‍රවශීලතාව අඩුවීම පිළිඹිබු විය. ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කර නිකුත් කිරීම දේශීය ණය සුරැකුම්පත් සඳහා වන පොළී අනුපාතික මත වු පීඩනය කිසියම් දුරකට අවම කිරීමට හේතු වුවද රජය වෙත විදේශීය මුල්‍ය සම්පත් ලැබීමේ ප්‍රමාද වීම් හමුවේ රජය ඉහළ දේශීය මුල්‍යන අවශ්‍යතා පිළිබඳ වෙළෙඳපල අපේක්ෂා හා වෙන්දේසි ක්‍රමය මත පමණක් රජය සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා මහ බැංකුව විසින් ගනු ලැබූ තීරණය හේතුවෙන් රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතිකය මත ඉහළ පීඩනයක් ඇති විය. වාණිජ බැංකු විසින් තැන්පතු සඳහා ගෙවනු ලබන පොළී අනුපාතික 2015 වසර තුල අඩු මට්ටමක පැවතිය ද වසරේ මැද භාගයේ සිට එම පොළී අනුපාතික ක්‍රමයෙන් ඉහළ යාමක් දක්නට ලැබුණි. 2015 වසර අවසානයේදී බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය 2014 වසර අවසානයේ පැවති සියයට 7.33 සිට 2015 වසර අවසානයේදී සියයට 7.57 දක්වා පදනම් අංක 24 කින් ඉහළ ගිය අතර 2014 වර්ෂයේ දී සියයට 11.91 වු බරිත සාමාන්‍ය ණය පොළී අනුපාතිකය 2015 වසරේ අවසාන වන විට සියයට 11 දක්වා පදනම් අංක 91 කින් අඩුවිය. කෙසේ වෙතත් වසරේ අවසාන කාලය තුළ කෙටිකාලීන පොලී අනුපාතික වල සිදු වූ ක්‍රමික ඉහළ යාම පිළිඹිබු කරමින් සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතකය 2014 වසර අවසානයේ පැවති සියයට 6.26 සිට 2015 වසර අවසානයේ සියයට 7.53 ක් දක්වා පදනම් අංක 127 කින් ඉහළ ගියේ ය.

**සමාලෝචනය**

ශ්‍රී ලංකා ආර්ථිකය 2015 වසරේ කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශයන් හා බැදුණු ක්‍රියාකාරකම් හේතුවෙන් වර්ධනයක් පෙන්නුම් කළේය. 1995 මාර්තු මාසයෙන් පසුව උද්ධමනය සෘණ අගයක් ගත් ප්‍රථම අවස්ථාව උදා වුයේ ද මෙම වසරේ ජුලි සැප්තැම්බර් කාලයේදී ය. මූලික උද්ධමනය පිළිබඳ සැලකීමේ දී 2015 පෙබරවාරි මාසයේ අවසානයේ පැවති අගයට වඩා වැඩි අගයක් වසර අවසානය වන විට ඉහළ ගියේ ය.මේ සඳහා ප්‍රධාන හේතු වුයේ බැංකු විසින් සපයන ලද ණය වර්ධනය ඉහළ යාම සහ රාජ්‍ය අංශයෙහි සහ ආර්ථිකයෙහි අනෙකුත් අංශවල සේවකයන්ගේ වැටුප් ඉහළ යාමයි. මේ අතර අඩු ඉන්ධන මිල ගණන් හා අඛණ්ඩව වර්ධනය වන සංචාරක අංශය තුළින් ඉහළ ප්‍රතිලාභ ලැබුණද, විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ ඇතුලුව ශුද්ධ විදේශ මුල්‍ය ප්‍රවාහ ලැබීම් මන්දගාමී වීම හා ප්‍රාග්ධන ප්‍රවාහ ආපසු ගලා යාම හේතුවෙන් ගෙවුම් ශේෂයේ හිඟයක් වාර්තා විය. රජයේ බදු සහ බදු නොවන ආදායම් අඩුවීමේ ප්‍රවණතාව වලක්වා ගැනීමට දරන ලද ප්‍රයත්නය තරමක් දුරට සාර්ථක වු නමුත් ,රාජ්‍ය අයවැයෙහි වියදම් විශාල ලෙස ඉහළ යාම අයවැය හිඟය ඉහළ යාමට හේතු වීය. ඉහළයමින් පැවති ඉල්ලුම් පීඩන තුළින් මිල මට්ටම සහ මූල්‍ය ස්ථායිතාව කෙරෙහි ඇතිවන අහිතකර බලපෑම් වැළක්වීමට මෙන්ම ගෙවුම් තුලනය මත ඇතිවන පීඩනය යටපත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව නිසි කලට නිවැරදි ක්‍රියා මාර්ග අනුගමනය කර ඇත. විනිමය අනුපාතික කළමනාකරණය කිරීමේදී වඩාත් නම්‍යශීලී පිළිවෙත් අනුගමනය කිරිම, ඉල්ලුම කළමනාකරණයක් ලෙස සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ගයක් වන වටිනාකම් මත උපරිම ණය අනුපාතය පැනවීම යන ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ඉහල නැංවීම මෙන්ම පසුකාලීනව මහ බැංකුවේ ප්‍රතිපත්ති අනුගමනය කිරීම යනාදී මෙසේ ගන්නා ලද ක්‍රියාමාර්ග විය. අපනයනය මූලික කරගත් ආර්ථික වර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම යන ඉහළ යන වේගය ණය පාලනය කිරිමට හැකිවන පරිදි රාජ්‍ය ආදායම ඉහල නංවා ගැනිම රජයේ මැදිකාලීන ආර්ථික ක්‍රමෝපායේ ප්‍රධාන අරමුණ වන අතර මේ සඳහා රජය විසින් යෝජනා කර ඇති ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ජාත්‍යන්තර මුල්‍ය අරමුදල විසින් ද අනුමත කරනු ඇතැයි අපේක්ෂිත ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

මහ බැංකු වාර්ෂික වාර්තාව, (2015).ශ්‍රී ලංකා මහ බැංකුව.

ගුණරත්න සුමුදු,(2013 නොවැ/දෙසැ ).මෑතකාලීන ආර්ථික ප්‍රවනතා, සටහන, වෙළුම 32, ශ්‍රී ලංකා මහ බැංකුව.

සේමසිංහ ඩබ්ලිව්.එම් (1998).මුදල් සැපයුම හා එහි මෑත කාලීන ප්‍රවණතා(ශ්‍රී ලංකාව ආශ්‍රිත විග්‍රහයක්),ආර්ථික විමර්ශන,01 වෙළුම,ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය,කැලණිය විශ්වවිද්‍යාලය.

අතපත්තු ඩැනී,(2009).ආර්ථික විද්‍යා ප්‍රවේශය 1, කර්තෘ ප්‍රකාශන,තරංජි ප්‍රින්ට්ස්,මහරගම.

අතපත්තු ඩැනී, (2011). ආර්ථික විද්‍යා ප්‍රවේශය 02, කර්තෘ ප්‍රකාශන,තරංජි ප්‍රින්ට්ස්,මහරගම.